// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2038/72 – 2017 සැප්තැම්බර් මස 29 වැනි සිකුරාදා – 2017.09.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

නැගෙනහිර පළාත් සභාවේ 2009/02 දරන නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තියේ 11 (8) වගන්තිය යටතේ පනවනු ලබන රෙගුලාසි මෙමගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

මෙම රෙගුලාසි 2017 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

Z.A. නසීර් අහමඩ් (ඉංජිනේරු)
ප්‍රධාන අමාත්‍ය, මුදල් සැලසුම්, නීතිය හා සාමය පළාත් පාලන හා
ප්‍රාදේශීය පරිපාලන, ග්‍රාමීය සංවර්ධන, සංචාරක
පරිසර, ගොඩනැගිලි හා ඉදිකිරීම්, ප්‍රවාහන සහ
ග්‍රාමීය කර්මාන්ත හා නිවාස අමාත්‍ය,
නැගෙනහිර පළාත් සභාව.

රෙගුලාසි

01. මෙම රෙගුලාසි නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ "2017 අංක 01 දරන කුලී වැන්රථ මගී ප්‍රවාහන සේවා රෙගුලාසි" යනුවෙන් හඳුන්වනු ලබන අතර, එම රෙගුලාසි 2017 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන්නේය.

02. 2017.09.01 වැනි දින සිට නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අවසර පත්‍රයක් හෝ ලියාපදිංචි වීමක් නොමැතිව වෙන් වෙන් වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන් හෝ ගාස්තු අය කිරීමකින් හෝ කුලී පදනම මත ගාස්තු අය කිරීමකින් හෝ මගී ප්‍රවාහනයේ නොයෙදිය යුතුය.

03. කුලී වැන්රථයේ ලියාපදිංචි අයිතිකරු නොවන අයෙකුට අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

04. අවසර පත්‍රයක් නිකුත් කිරීමේදී අදාළ පළාත් පාලන බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට ප්‍රමුඛත්වයක් දිය යුතුය.

05. අවසර පත්‍රයක් නිකුත් කිරීමට, අලුත් කිරීමට හෝ එක් කුලී වැන්රථ නැවතුම්පොලක සිට තවත් කුලී වැන් රථ නැවතුම් පොලකට මාරු කිරීමට හෝ එවැනි ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමට අධිකාරියට අයිතිය ඇත්තේය.

5.1 එම අභිමතය පාවිච්චි කිරීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව අධිකාරිය සැලකිල්ලට ගත යුතුය.

(අ) අදාළ කුලී වැන්රථ නැවතුම්පොලෙහි ක්‍රියාත්මක වන කුලී වැන්රථ වලින් මගී ප්‍රවාහන අවශ්‍යතා කොතෙක් දුරට ඉටු වී ඇත්ද? යන වග.


මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ආ) අදාළ කුලී වැන්රථ නැවතුම්පොලෙහි දැනට ක්‍රියාත්මක වන කුලී වැන්රථ වලින් මගී අවශ්‍යතා සම්පූර්ණ වී ඇත්නම්, එම ස්ථානයට අලුත් අවසර පත්‍රයක් නිකුත් කිරීම යෝග්‍ය වන්නේ ද? යන්න.

(ඇ) කුලී වැන්රථ නැවතුම්පොලකට අයිති බල ප්‍රදේශය කුමක්දැයි තීරණය කළ යුතු අතර, නැවතුම්පොලේ සිට ක්‍රියාත්මක නොවන කුලී වැන්රථ එම නැවතුම්පොලට අදාළ කුලී වැන්රථ සංඛ්‍යාවට ඇතුළත් ලෙස සලකනු ලැබේ.

06. අවසර පත්‍රය ලබා ගැනීමේදී අලුත් කිරීමේදී, මාරු කිරීමේදී හෝ සංශෝධනය කිරීමේදී සෑම අයදුම් පත්‍රයක්ම මාසයක් ඇතුළත ලියාපදිංචි අයිතිකරු විසින් හෝ සමිතියක්/ සමාගමක් හෝ සංවිධානයක් සම්බන්ධයෙන් වන විට එහි බලයලත් නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය (උපලේඛන 1) අනුව ඉදිරිපත් කළ යුතු වේ. එම අයදුම් පත්‍රය සමග පහත සඳහන් ලියවිලි හා ගාස්තු (උපලේඛන 4) ඉදිරිපත් කළ යුතු වේ.

6.1 කුලී වැන්රථය ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ එය ලියාපදිංචි කිරීමේ විස්තරය ඇතුළත්ව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් සහ ඒ සහතිකයේ ඡායාස්ථික පිටපතක්.

6.2 තුන්වන පාර්ශවය සහ කුලී වැන්රථයේ ගමන් ගන්නා සියලුම මගීන්ට පූර්ණ සහ අසීමිත රක්ෂණ ආවරණය සලසන රක්ෂණ සහතිකය.

6.3 වාර්ෂික ආදායම් බලපත්‍රය සහ එහි ඡායාස්ථික පිටපතක්.

6.4 රියදුරු සම්බන්ධයෙන් වෛද්‍ය සහතිකය සහ එහි ඡායාස්ථික පිටපතක්.

6.5 අයදුම් පත්‍රය අවසර පත්‍රයක් අලුත් කරවා ගැනීම සඳහා නම්, අවසර පත්‍ර පොත.

6.6 අධිකාරිය විසින් නියම කර ඇති ගාස්තුව ඇතුළත් සටහන.

6.7 කුලී වැන්රථය වෙනත් පළාත් සභාවක ධාවනය කරන ලද කුලී වැන්රථයක් නම් මුදා හැරීමේ ලිපිය.

6.8 අධිකාරිය විසින් පිළිගත් කුලී වැන්රථ ධාවකයින්ගේ සමිතිය/සමාගම හෝ සංවිධානය විසින් නිකුත් කරන ලද සාමාජික සහතිකය.

07. අවසර පත්‍රය මෙහි දෙවැනි උපලේඛනයේ පරිදි විය යුතුය.

08. අවසර පත්‍ර ලේබලය (වින්ස්ක්‍රීන් ලේබලය) මෙහි තුන්වන උපලේඛනයේ පරිදි විය යුතුය.

09. අධිකාරිය විසින් නියම කරන ලද කුලී ගමන් ගාස්තු ක්‍රමය මෙහි හතර වන උපලේඛනය පරිදි විය යුතුය.

10. මගී සේවා අවසර පත්‍රයක් සඳහා ඉදිරිපත් කරන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එම අවසර පත්‍රය වලංගු කර වීමට ඉල්ලුම්කරු අපේක්ෂා කරන දිනට මාසයකට නොඅඩු කාලසීමාවකට පෙර ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

11. අවසර පත්‍රයට මෙහි පහත සඳහන් නියමයන් සහ කොන්දේසි ඇතුළත් වේ.

11.1 අවසර පත්‍රය පවරා දිය නොහැක.

11.2 අවසර පත්‍රයේ අන්‍යාකාරව සඳහන් කර ඇත්තේ නම් මිස, නිකුත් කරනු ලැබූ දින සිට මාස 12ක කාලයක් සඳහා අවසර පත්‍රය බලාත්මකව පවතින්නේය.

11.3 අවසර පත්‍රයේ මුල් පිටපත සහ ලේබලය රියදුරු විසින් කුලී වැන්රථයේ රැගෙන යා යුතුය.

11.4 අධිකාරිය විසින් නිකුත් කරන ලද අවසර පත්‍ර ලේබලය කුලී වැන්රථයේ ඉදිරිපස වීදුරුවේ (Windscreen) වම් පැත්තේ ප්‍රදර්ශනය කළ යුතුය.

11.5 අවසරපත්‍රධාරියෙකු සහ ඔහුගේ සේවකයින් විසින් අදාළ සේවය සැපයීම සඳහා යොදා ගන්නා කුලී වැන් රථය මනා යාන්ත්‍රික තත්වයෙන් සහ ධාවනයට යෝග්‍ය සහ පිරිසිදු තත්වයෙන් සෑම විටම නඩත්තු කර ගත යුතුය.

11.6 මීට අමතරව මෙම රෙගුලාසි වලට අවසරපත්‍රධාරියෙකුගේ වගකීම සහ කුලී වැන් රථ රියදුරුගේ වගකීම්ද අවසරපත්‍රයට අදල නියමයන් සහ කොන්දේසි ලෙස සැලකේ.

12. කුලී වැන්රථයෙහි ප්‍රදර්ශනය කළ යුතු හා තබා ගත යුතු ලේඛන.

12.1 රියදුරු විසින් කුලී වැන්රථයේ තබා ගත යුතු ලේඛන.

(අ) අවසර පත්‍රයේ මුල් පිටපත හා ලේබලය

(ආ) රියදුරු සඳහා වෛද්‍ය සහතිකය

(ඇ) අධිකාරිය විසින් අනුමත කළ කුලී වැන්රථ කුලී ගාස්තු චක්‍රය.

(ඉ) මෝටර් රථ ගමනා ගමන ආඥා පනත යටතේ ගෙන යා යුතු දෑ.

(1) ආදායම් බලපත්‍රය.

(11) රක්ෂණ සහතිකය.

(111) රියදුරු බලපත්‍රය.

12.2 ප්‍රදර්ශනය කළ යුතු දෑ:-

(අ) කුලී වෑන්රථ මගී සේවා අවසරපත්‍ර ලේබලයේ ඡායාස්රීක පිටපත.

(ආ) කුලී වෑන්රථයේ ඇතුළත දුම්බීම තහනම් බව ප්‍රකාශිත දැන්වීම

(ඇ) නියමිත ගාස්තු චක්‍රය දක්වෙන ගාස්තු සටහන.

(ඉ) අධිකාරිය විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයේ අංකය සහ කුලි වෑන්රථයේ ලියාපදිංචි අංකය.

13 .අවසරපත්‍රධාරියාගේ වගකීම් :-

13.1 අවසරපත්‍රධාරියා විසින් අධිකාරිය විසින් පිළිගනු ලැබූ කුලී වෑන්රථ සමිතියේ/ සමාගමේ හෝ සංවිධානයේ විධිවිධාන වලට යටත්ව තම කුලී වෑන්රථය ධාවනය කළ යුතුය.

13.2 කුලී වෑන්රථය යම් හදිසි අනතුරක් සිදුවී දින 07ක් ඇතුළත කුලී වෑන්රථ සමිතිය/සමාගම හෝ සංවිධානය හරහා අධිකාරියට දැන්විය යුතුය.

13.3 බරපතල හෝ මාරක අනතුරක් සම්බන්ධයෙන් වන විට නව යෝග්‍යතා සහතිකයක් ලබා ගන්නා තෙක් කුලී වෑන්රථය ධාවනයේ නොයෙදවිය යුතුය.

13.4 බරපතල හෝ මාරක රිය අනතුරක් කරන ලද කුලී වෑන්රථ රියැදුරෙකු සුදුසු සෞඛ්‍ය තත්වයෙන් සිටින බවට සහතික කරන තුරු නැවත සේවයේ නොයෙදවිය යුතුය. (බරපතල හදිසි අනතුරු යන්නෙන් අනතුරේ ප්‍රතිඵලයක්)

වශයෙන් තුවාල ලැබූ තැනැත්තෙකු දවස් 07 කට අධික කාලයක් රෝහල් ගතව ප්‍රතිකාර ගැනීම හෝ රුපියල් 10,000/-ට වැඩි අලාභයක් දේපළවලට සිදුවූ අවස්ථාව අදහස් කෙරේ. රෝද හතරම මහා මාර්ගයෙන් ඉවතට ගිය අනතුරු ද බරපතල අනතුරු ලෙස සැළකේ. මාරක අනතුරු යන්නෙන් අනතුරට පාත්‍ර වූ තැනැත්තෙකු එම හේතුව නිසාම මරණයට පත්වීම අදහස් කෙරේ)

14. කුලී වෑන්රථයේ රියදුරුගේ වගකීම :-

14.1 කුලී වෑන්රථයේ ගමන් ගන්නා සියලු මගීන්ගේ ආරක්ෂාව හා සුවපහසු සහතික වන ආකාරයෙන් කුලී වෑන්රථය පැදවිය යුතුය.

14.2 අනුමත මගීන් සංඛ්‍යාව ඉක්මවා කුලී වෑනරථය ධාවනය නොකළ යුතුය.

14.3 යහපත් හැසීරීමෙන් හා කල්ක්‍රියාවෙන් යුක්ත විය යුතු අතර, සියලු මගීන්ට මෙන්ම රජයේ සහ වෙනත් නිලධාරීන්ටද ආචාර සම්පන්න හා විනීත විය යුතුය.

14.4 මත්පැන් හා මත් ද්‍රව්‍යය පාවිච්චි කර සේවයේ යෙදීම හෝ සේවා කාලය තුළ මත් ද්‍රව්‍යය හෝ මත්පැන් පාවිච්චි නොකළ යුතුය.

14.5 අපරික්ෂාකාරීව, නොසැලකිලිමත්ව හා අන්ත්‍රාදයකව කුලී වෑන් රථය පැදවීම නොකළ යුතුය.

14.6 කුලී වෑන්රථ රියදුරු අධිකාරියේ ලියාපදිංචි වූ රියැදුරෙකු විය යුතුය.

14.7 කුලී වෑන්රථ නැවැතුම්පල ඇතුළත නියමිත ස්ථානයේ හැර, නැවැතුම්පල අවහිර වන සේ කුලී වෑන්රථය නතර කර නොතිබිය යුතුය.

14.8 කුලී වෑන්රථයේ සේවය කරන සෑම විටකම අධිකාරිය විසින් නියම කරනු ලැබූ නිළ ඇඳුමක් හෝ නිළ හැඳුනුම් පතක් පැළැඳ සේවය කළ යුතුයි.

14.9 හදිසි අනතුරක්/කාර්මික දෝෂයක් වැනි නොවැළැක්විය හැකි හේතුවක් මත කුලී වෑන්රථය මගියාගේ ගමනාන්තය දක්වා යාමට නොහැකි වූ අවස්ථාවක දී එම හදිසි අනතුර/කාර්මික දෝෂය සිදු වූ ස්ථානය දක්වා පමණක් ගාස්තු අය කළ යුතු ය. එවැනි අවස්ථාවකදී මගියාට විකල්ප ප්‍රවාහන මාර්ගයක් සලසා දීමට සියළු උත්සාහයන් දැරිය යුතුය.

14.10 කිසියම් මගියෙකුගෙන් අධිකාරියෙන් අනුමත ගාස්තුවට වැඩි හෝ අඩු මුදලක් අය කිරීම හෝ ලබා ගැනීම නොකළ යුතුය.

14.11 කුලී වෑන්රථය තුළ කිසිවෙකුට දුම්පානයට ඉඩ නොදිය යුතුය.

15. මගීන්ගේ වගකීම් :-

15.1 කුළී වැන්රථය තුළ දුම්පානය, මත්පැන් හෝ මත්ද්‍රව්‍ය පාවිච්චි නොකළ යුතුය.

15.2 කුළී වැන්රථය තුළ සංවරශීලීව හැසිරිය යුතුය.

16. කුළී වැන් රථ ධාවකයින්ගේ සංවිධානයට අදල රෙගුලාසි :

16.1 සෑම පළාත් පාලන බල ප්‍රදේශයක් සඳහාම සමාගම් ආඥා පනත හෝ සමුපකාර ආඥා පනත හෝ පළාත් පාලන ආඥා පනත යටතේ ලියාපදිංචි වූ කුළී වැන්රථ ධාවකයින්ගේ සමිතියක්/ සමාගමක් හෝ සංවිධානයක් තිබිය යුතුය.

16.2 මෙම රෙගුලාසිවල සඳහන් කොන්දේසි වලට අනුව ධාවකයින් කටයුතු කරන බවට වග බලා ගැනීම එකී සමිතියේ/ සමාගමේ හෝ සංවිධානයේ වගකීම වේ.

16.3 මෙම රෙගුලාසිවල සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විධි-විධාන කුළී වැන්රථ සමිතියේ /සමාගමේ හෝ සංවිධානයේ ව්‍යවස්ථාවට ඇතුළත් විය යුතුය.

17. කුළී වැන්රථ නැවැතුම්පොල සඳහා රෙගුලාසි :

17.1 පළාත් පාලන ආයතනවල එකඟත්වය ඇතිව අධිකාරිය විසින් අවශ්‍ය කුළී වැන්රථ නැවැතුම්පොල සංඛ්‍යාවක් පිහිටු විය හැකිය.

17.2 අධිකාරිය විසින් පනවනු ලබන කොන්දේසි වලට යටත්ව කුළී වැන්රථ සමිති/ සමාගම් හෝ සංවිධාන විසින් එම නැවැතුම්පොළ සංවිධාන කටයුතු කළමනාකරණය කළ යුතු ය.

17.3 පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතු නැවැතුම්පොළ ගාස්තු එකී සමිති/ සමාගම් හෝ සංවිධාන විසින් ගෙවිය යුතුය.

18. කුළී වැන්රථ රියදුරන් විසින් රෙගුලාසි කඩ කිරීම අවසරපත්‍රධාරියෙකු විසින් රෙගුලාසි කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ. එහෙත් කුළී වැන්රථ රියදුරු අධිකාරියේ ලියාපදිංචි රියැදුරෙකු වන්නේ නම් අවසරපත්‍රධාරියෙකු ඊට වගකිව යුතු නොවේ.

19. අධිකාරිය විසින් කලින්- කලට නියම කරනු ලබන කුළී වැන්රථ ගාස්තු සටහන් වලට අනුකූළ වන සේ කුළී වැන්රථ ගාස්තු අය කළ යුතුය.

20. මේ ප්‍රඥප්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් කරන ලද අවසරපත්‍රධාරියෙකු විසින් අධිකාරිය වෙත එය අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ විට එම අවසරපත්‍රධාරියෙකු :

(I) මේ ප්‍රඥප්තියේ විධි-විධාන හා ඒ යටතේ සාදන ලද රෙගුලාසි අනුව ක්‍රියාකර ඇති බවට,

(II) මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබ නොමැති බවට,

(III) අධිකාරියට ගෙවිය යුතු බවට නියම කර ඇති සියලුම ගාස්තු ගෙවා ඇත්නම් හා අනිකුත් අදළ කොන්දේසි ඉටුකර ඇති බවට සෑහීමකට පත්වන්නේ නම් ඒ අවසර පත්‍රයේ වලංගු කාලය ඉකුත් වන දින සිට එක් අවුරුද්දක කාලයක් සඳහා හෝ ඊට අඩු කාලයකට ඒ අවසර පත්‍රය අධිකාරිය විසින් අලුත් කරනු ලැබිය හැකිය.

21. මෙම රෙගුලාසි උල්ලංඝනය කරන, පැහැර හරින, නොසලකා හරින කිසියම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, ඔහු/ඇය 2009 අංක 02 දරණ නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරී ප්‍රඥප්තියේ 44 වැනි වගන්තිය යටතේ ක්‍රියා කිරීමට යටත් වන්නේ ය.

22. අධිකාරිය විසින් බලය පවරනු ලැබූ නිලධාරී/ නිලධාරීන් හෝ පරීක්ෂණ කණ්ඩායම/ කණ්ඩායම් විසින් කරනු ලබන පරීක්ෂණයකදී උපලේඛන 05 යටතේ ඇති රෙගුලාසි උල්ලංඝණය වී ඇති බව එම රෙගුලාසි කඩ කරන ලද පාර්ශවය ද පිළිගන්නා අවස්ථාවන්හි පහත සඳහන් ක්‍රියා මාර්ග ගැනීමට අධිකාරියට බලය ඇත.

(I) පරීක්ෂණයකදී අනාවරණය වූ රෙගුලාසි කඩ කිරීම මින් ඉදිරියට නොකරන බවට හෝ නිවැරදි කර ගන්නා බවට හෝ නිවැරදි කර ගන්නා බවට ප්‍රකාශයකට අත්සන් ගැනීමට ; සහ

(II) පරීක්ෂනය සඳහා වන පරිපාලන වියදම් හා අනෙකුත් වියදම් වශයෙන් උපලේඛනය 05 කොටසේ රෙගුලාසි කඩවීම සම්බන්ධව එහි සඳහන් ගාස්තු අය කිරීමට.

(III) අවසරපත්‍ර ධාරියා ඉහත (1) සහ (11) යටතේ කටයුතු කිරීමට එකග වන්නේ නම් අවසරපත්‍ර ධාරියාට විරුද්ධව 2009 අංක 02 දරන නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරී ප්‍රඥප්තියේ 11(4) යටතේ ක්‍රියා කිරීමට හෝ 44 වැනි වගන්තිය අනුව නඩු පැවරීමට හෝ පවත්වාගෙන යාමට හෝ නොකිරීමට අධිකාරියට බලය ඇත.

23. යම් අවසරපත්‍ර ධාරියෙකු ඔහුගේ කැමැත්ත පරිදි අවසර පත්‍රයේ අයිතිය වෙනත් අයෙකුට පැවරිය නොහැකිය. එවැනි පැවරීමක් කළහොත් එය බලරහිත වේ. එතකුදු වුවත්, ප්‍රදේශයේ මගී ඉල්ලුම සපුරාලීමට අවශ්‍යයැයි අධිකාරිය අදහස් කරන අවස්ථාවකදී අවසරපත්‍රයේ අයිතිය මාරු කළ හැකිය.

24. කුළී වැන් රථ ධාවක කළමනාකරණය සම්බන්ධයෙන් පිළිගත් සමිති/සමාගම් හෝ සංවිධාන විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටීන් පිළිබඳව උපදෙස් නිකුත් කිරීමට අධිකාරියට හැකිය. එමෙන් ම, ඔවුන් විසින් නඩත්තු කළයුතු වාර්තා සහ අධිකාරියට සැපයිය යුතු වාර්තා සම්බන්ධයෙන් ද අධිකාරියට උපදෙස් නිකුත් කළ හැකිය.

උපලේඛනය 1

කුළී වෑන්රථ මගී සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රය.
නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

| 01. කුළී වෑන්රථයේ අයිතිකරු පිළිබඳ තොරතුරු: | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|

1. කුළී වෑන්රථයේ අංකය : .....................

1.1. සම්පූර්ණ නම : ........................................
........................................

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |

මුලකුරු සහිතව නම : ...................................
........................................

1.2. ලිපිනය : ........................................
........................................

1.3. දුරකථන අංකය : ..........................

1.4. ජාතික හැඳුනුම්පත් අංකය : ........................

1.5. අයදුම්කරු පදිංචි

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |

1.5.1. පළාත : .....................

1.5.2. දිස්ත්‍රික්කය : ..............................

1.5.3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : .....................

1.5.4. ග්‍රාම සේවක කොට්ඨාශය : .....................

1.5.5. අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක/ සන්නද්ධ සේවාවක සේවයෙහි නියුක්තද? ඔව්/නැත.

1.5.6. ''ඔව්'' නම් අදාළ ආයතනයෙහි නම :...................

1.6. විවාහක නම් කලත්‍රයාගේ නම සහ ලිපිනය : ...................
.................................................
.................................................

1.7. ග්‍රාම නිලධාරි තැනගේ සහතිකය :
ඉහත නම සඳහන් අයදුම්කරු විසින් ඉහතින් සඳහන් කර ඇති විස්තර නිවැරදි බවට සහතික කරමි.

දිනය :............ ........................
ග්‍රාම නිලධාරි අත්සන

1.8. අයිතිකරු වෙනත් කුළී වෑන්රථ සඳහා මගී සේවා අවසර පත්‍ර ලබා ඇත්නම් පහත සඳහන් විස්තර දක්වන්න

| කුළී වෑන්රථයේ ලියාපදිංචි අංකය | ලබා ගත් ආයතනය | බලපත්‍ර අංකය | දිනය |
|---|---|---|---|
| | | | |

| 2. කුළී වැන්රථය පිළිබඳ තොරතුරු: | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|

2.1. කුළී වැන්රථයේ ලියාපදිංචි අංකය :

2.2. (අ) නිෂ්පාදිත රට : ................................
(ආ) වර්ගය : ............................

2.3. අනුමත මගී සංඛ්‍යාව :

2.4. නිෂ්පාදිත වර්ෂය :

2.5. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ලියාපදිංචි කළ දිනය :

වර්ෂය මාසය දිනය

2.6. කුළී වැන්රථයේ මිල රු : ........................

2.6.1. බර : ........................

2.7. මෙම කුළී වැන්රථය සඳහා වෙනත් අධිකාරියක් මගින් අවසර පත්‍රයක් ලබා තිබේද ? (ඔව්/නැත)

2.7.1. කුළී වැන්රථය දැනට ධාවනය කරන්නේද ? (ඔව්/නැත)

2.7.2. එසේ ධාවනය නොවන්නේ නම් පහත සඳහන් විස්තර දක්වන්න :

| ලබාගත් ආයතනය | බලපත්‍ර අංකය | අවලංගු වන දිනය | බලපත්‍රය දීර්ඝ නොකිරීමට හේතුව |
|---|---|---|---|
| | | | |

**2.8.** මෙම කුළී වැන්රථය සඳහා කිසියම් ආකාරයේ නඩු විභාගයක් තිබේද? (ඔව්/නැත)
"ඔව්" නම් විස්තර සඳහන් කරන්න : ........................
..................................................
..................................................

**2.9. රක්ෂණ ආවරණය පිළිබඳ විස්තර :**

2.9.1. රක්ෂණ සමාගමේ/ සංස්ථාවේ නම : ...................
..........................................

2.9.2. රක්ෂණ වර්ගය:
1. ..........................................
2. ..........................................
3. ..........................................

2.9.3. රක්ෂණ ආවරණයේ වටිනාකම : ....................

2.9.4. අවලංගු වන දිනය : ..............................

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

2.10. ආදායම් බලපත්‍රය අවලංගු වන දිනය : . . . . . . . . . . . . . . . . .

2.11. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නම : . . . . . . . . . . . . . . . . . .

2.12. කුළී වෑන්රථ නැවතුම් පොල : . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2.13. නිවසේ සිට කුළී වෑන්රථ නැවැතුම්පොල දක්වා දුර කි.මී : . . . . .

03. කුළී වෑන්රථ රියැදුරු පිළිබඳ විස්තර :

3.1. සම්පූර්ණ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3.2. මුලකුරු සහිත නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3.3. උපන් දිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3.4. ලිපිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3.5. ජාතික හැඳුනුම්පත් අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3.6. කුළී වෑන්රථ රියැදුරු බලපත්‍ර අංකය : . . . . . . . . . . . . . . . . . . .

3.6.1. බලපත්‍රය ආබාධිත රියදුරු බලපත්‍රයක්ද යන වග : . . . . . .

3.6.2. ලබාගත් දිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3.6.3. රියැදුරු බලපත්‍රය අවලංගු වන දිනය :. . . . . . . . . . . . . .

3.7. වෛද්‍ය සහතිකය පිළිබඳ විස්තර : . . . . . . . . . . . . . . . . . . . . . . .

3.7.1. සහතිකයේ අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3.7.2. නිකුත් කළ දිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3.7.3. අවලංගු වන දිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3.8. නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් පවත්වනු ලබන කුළී වෑන්රථ රියැදුරු පුහුණු වැඩ සටහන් වලට සහභාගී වූයේද ?
(ඔව්/නැත):

3.9. කුළී වෑන්රථ මගී සේවා රියැදුරු ලියාපදිංචි සහතිකයේ අංකය : . . . . . . .

3.10. අනතුරු ඇත්නම් ඒ පිළිබඳ විස්තර :
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3.10.1. පසුගිය වසර 03ක අනතුරු විස්තර :

| මාරක | බරපතල | ලොකු | පොලිස් බල ප්‍රදේශ |
|---|---|---|---|
| | | | |

3.10.2. අවසාන නොවූ නඩු විභාගයක් තිබේ ද ? (ඔව්/නැත)
එසේ ඇත්නම් ඒ පිළිබඳ විස්තර :

| අනතුර සිදු වූ දිනය : | | | |
|---|---|---|---|
| අනතුරේ ස්වභාවය | | | |
| තුවාල වූ ගණන | | | |
| මරණ සංඛ්‍යාව | | | |
| දේපළ අලාභහානි රුපියල් (දළ වශයෙන්) | | | |
| නඩුව විභාග වන උසාවිය | | | |

3.10.3. අනතුරින් පසු :

(අ) රියැදුරු තැන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වූයේ ද ?

(ඔව්/නැත)

(ආ) ඔහු සංස්කරණ පුහුණු පාඨමාලාවකට සහභාගී වූයේ ද ?

(ඔව්/නැත)

(ඇ) කුළී වැන්රථ රියැදුරු බලපත්‍රය

1. තාවකාලිකව අත්හිටුවන ලද්දේද ? (ඔව්/නැත)

2. අවලංගු කරන ලද්දේද ?(ඔව්/නැත)

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම අවසර පත්‍රයට අදාළ කොන්දේසි/ නියෝග/රෙගුලාසි කඩකළහොත් හෝ අධිකාරියේ හෝ කුළී වැන්රථ ධාවක සමිතියේ/ සංගමයේ හෝ සංවිධානයේ උපදෙස් අනුව ක්‍රියා නොකළ හොත් මාගේ අවසර පත්‍රය අවලංගු කිරීමට/ අත්හිටුවීමට/ අධිභාරයක් අය කිරීමට හෝ ප්‍රඥප්තිය යටතේ දඬුවම් ලැබීමට සිදුවන බව මම හොඳින් තේරුම් ගෙන මාගේ සුපුරුදු අත්සන තබා අයදුම්කර සිටිමි.

දිනය : ..............................

..............................
අයදුම්කරුගේ අත්සන

උපලේඛනය 2

## නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.



# කුලී වෑන්රථ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය

කුලී වෑන්රථයේ ලියාපදිංචි අංකය :- ............................................

**අධ්‍යාපන අමාත්‍යාංශ ගොඩනැගිල්ල, ඇතුළු වරාය පාර, ත්‍රිකුණාමලය.**

**2009 අංක 02 දරන නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි ප්‍රඥප්තිය.**

**මගීන් ප්‍රවාහනය කිරීම පිණිස නිත්‍ය සේවාවක් පවත්වාගෙන යාම සඳහා කුලී වැන්රථ ධාවන අවසර පත්‍රය - (11.8 වන වගන්තිය)**

**කුලී වැන්රථයකට/ කුලී වැන්රථ සමූහයකට අදාලව නිකුත් කරනු ලැබේ.**

**කුලී වැන්රථ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය**

අවසර පත් අංකය :

1. කුලී වැන්රථයේ ලියාපදිංචි අංකය :

2. අයිතිකරුගේ / අයිති ආයතනයේ නම :

3. අයිතිකරුගේ / ආයතනයේ ලිපිනය :

4. අයත් වන දිස්ත්‍රික්කය :

5. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය :

6. කුලී වැන්රථ නැවැතුම්පොල :

7. අනුමත මගීන් සංඛ්‍යාව :

8. ඉහත සඳහන් කුලී වැන්රථය (හෝ එම කුලී වැන්රථය වෙනුවට මෙම අවසර පත්‍රයෙහි රථ ඇණිය යටතෙහි ඇතුළත් කර ඇති කුලී වැන්රථ අතුරින් එක් කුලී වැන්රථයක් හෝ) මෙහි සඳහන් කර ඇති පරිදි මගීන් ප්‍රවාහනය කිරීමට මෙයින් අවසර දෙනු ලැබේ.

9. මෙම අවසර පත්‍රය මෙහි 111 වන කොටසේ දක්වා ඇති නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව නිකුත් කරනු ලැබේ.

10. මෙම අවසර පත්‍රය කාල සීමාව ඉකුත් වන දින හෝ මගී ප්‍රවාහන අධිකාරියට අවශ්‍ය වුවහොත් එම දිනයට පෙර යම් අවස්ථාවක දී හෝ අධිකාරිය වෙත භාරදිය යුතුය.

සභාපති,
නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,
අධ්‍යාපන අමාත්‍යාංශ ගොඩනැගිල්ල,
ඇතුළු වරාය පාර,
ත්‍රිකුණාමලය.

දිනය : ..................................

**කුළී වැන්රථ මගී සේවා අවසර පත්‍රයට හිමි ධාවනය**

අංක ................................................ දරන කුළී වැන්රථ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයට අදලව ................................... දිස්ත්‍රික්කයේ ............................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ................................... ස්ථානයේ කුළී වැන් රථ නැවතුම්පලට අනුබද්ධිතව කුළී වැන්රථ මගී ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාමට මෙයින් අවසර දෙනු ලැබේ.

කුවිතාන්සි අංකය :

ලේබල් අංකය :

දිනය : .............................

අධ්‍යක්ෂ ජනරාල්,<br>
මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,<br>
නැගෙනහිර පළාත.

**(සංශෝධන 1)**

අංක ................................................ දරන කුළී වැන්රථ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයට අදලව ................................... දිස්ත්‍රික්කයේ ............................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ................................... ස්ථානයේ කුළී වැන් රථ නැවතුම්පලට අනුබද්ධිතව කුළී වැන්රථ මගී ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාමට මෙයින් අවසර දෙනු ලැබේ.

කුවිතාන්සි අංකය :

ලේබල් අංකය :

දිනය : .............................

අධ්‍යක්ෂ ජනරාල්,<br>
මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,<br>
නැගෙනහිර පළාත.

**(සංශෝධන 11)**

අංක ................................................ දරන කුළී වැන්රථ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයට අදලව ................................... දිස්ත්‍රික්කයේ ............................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ......................................... ස්ථානයේ කුළී වැන් රථ නැවතුම්පලට අනුබද්ධිතව කුළී වැන්රථ මගී ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාමට මෙයින් අවසර දෙනු ලැබේ.

කුවිතාන්සි අංකය :

ලේබල් අංකය :

දිනය : .............................

අධ්‍යක්ෂ ජනරාල්,<br>
මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,<br>
නැගෙනහිර පළාත.

වලංගු කාලසීමාව

අංක ........................................ දරන කුළී වැන්රථ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය 20...... ....................................................... මස ......................... දින සිට 20............ ..................................................... මස ....................................... දින දක්වා කාලය වලංගු වේ.

කුවිතාන්සි අංකය :

ලේබල් අංකය :

දිනය : ...................................

අධ්‍යක්ෂ ජනරාල්,
මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.
නැගෙනහිර පළාත.

දීර්ඝ කිරීම්/ I

අංක ........................................ දරන කුළී වැන්රථ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය 20...... ....................................................... මස ......................... දින සිට 20............ ..................................................... මස ....................................... දින දක්වා කාලය වලංගු වේ.

කුවිතාන්සි අංකය :

ලේබල් අංකය :

දිනය : ...................................

අධ්‍යක්ෂ (ධාවන හා සැලසුම්)
මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.
නැගෙනහිර පළාත.

දීර්ඝ කිරීම්/ II

අංක ........................................ දරන කුළී වැන්රථ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය 20...... ....................................................... මස ......................... දින සිට 20............ ..................................................... මස ....................................... දින දක්වා කාලය වලංගු වේ.

කුවිතාන්සි අංකය :

ලේබල් අංකය :

දිනය : ...................................

අධ්‍යක්ෂ (ධාවන හා සැලසුම්)
මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.
නැගෙනහිර පළාත.

දීර්ඝ කිරීම්/ III

අංක .......................................... දරන කුලී වෑන්රථ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය 20...... ...................................................... මස ......................... දින සිට 20............ .................................................... මස ...................................... දින දක්වා කාලය වලංගු වේ.

කුවිතාන්සි අංකය :

ලේබල් අංකය :

දිනය : ..................................

අධ්‍යක්ෂ (ධාවන හා සැලසුම්)
මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.
නැගෙනහිර පළාත.

දීර්ඝ කිරීම්/ IV

අංක .......................................... දරන කුලී වෑන්රථ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය 20...... ...................................................... මස ......................... දින සිට 20............ .................................................... මස ...................................... දින දක්වා කාලය වලංගු වේ.

කුවිතාන්සි අංකය :

ලේබල් අංකය :

දිනය : ..................................

අධ්‍යක්ෂ (ධාවන හා සැලසුම්)
මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.
නැගෙනහිර පළාත.

දීර්ඝ කිරීම්/ V

අංක .......................................... දරන කුලී වෑන්රථ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය 20...... ...................................................... මස ......................... දින සිට 20............ .................................................... මස ...................................... දින දක්වා කාලය වලංගු වේ.

කුවිතාන්සි අංකය :

ලේබල් අංකය :

දිනය : ..................................

අධ්‍යක්ෂ (ධාවන හා සැලසුම්)
මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.
නැගෙනහිර පළාත.

## උපලේඛනය 03
## உப அட்டவணை - 03
## Schedule - 03

නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
கிழக்கு மாகாண விதிப்பயணிகள் போக்குவரத்து அதிகாரசபை
Eastern Province Road Passenger Transport Authority

නිත්‍ය කුළී වෑන්රථ මගී ප්‍රවාහන සේවා අවසරපත්‍රය
**தினசரி வாடகை வேன் அனுமதி பத்திரம்**

**REGULAR TAXI PASSENGER SERVICE PERMIT**

අවසර පත්‍ර අංකය.
ஆனுமதி பத்திரம் இலக்கம்
Permit No.

කුළී වෑන්රථ අංකය.
வாடகை வேன் இல.
Taxi No.

නැවතුම්පොල.
தரிப்பிடம்.
Park.

වලංගු කාලය.
செல்லுபடி காலம்.
Validity.

සිට.
முதல்.
From.

දක්වා.
வரை.
To.

ප්‍රා.ලේ.කොට්ඨාසය.
பி.செ.பிரிவு.
D.S.Division.

පොලිස් බල ප්‍රදේශය.
பொலிஸ் பிரிவு.
Police Area.

දිස්ත්‍රික්කය.
மாவட்டம்.
District.

දිනය.
திகதி.
Date.

අධ්‍යක්ෂ ජනරාල්, නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
பணிப்பாளர் நாயகம், கிழக்கு மாகாண வீதிப்பயணிகள் போக்குவரத்து அதிகாரசபை
Director General, Eastern province Road Passenger Transport Authority

**උපලේඛනය 4**

**අධිකාරිය විසින් නියම කරන ලද ගාස්තුව**

01. මෙම රෙගුලාසි කුළී වැන්රථ මගින් මගී ප්‍රවාහනය කිරීමේ රෙගුලාසි යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ දක්වා ඇති කිසියම් විෂයක යම් කාර්යයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව, ඒ උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ දක්වා ඇති ගාස්තු ප්‍රමාණය විය යුතුය.

| | *I වැනි තීරුව*<br>*කාරණය* | *II වැනි තීරුව*<br>*ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය*<br>*රු. ශත* |
|---|---|---|
| 1. | අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 300.00 |
| 2. | කුළී වැන්රථ මගී සේවා අවසරපත්‍රයක් නිකුත් කිරීමේ ගාස්තුව | 7,500.00 |
| 3. | කුළී වැන්රථ මගී සේවා අවසරපත්‍රයක් අළුත් කිරීමේ වාර්ෂික ගාස්තුව | 2,500.00 |
| 4. | කුළී වැන්රථ මගී සේවා අවසර පතක් නියමිත දිනට දීර්ඝ නොකිරීම නිසා සමුච්චිත වන හිඟ මුදල මත 10% ක අධිභාරයක් අයකිරීම. | |
| 5. | කුළී වැන්රථ මගී සේවා අවසර පත්‍ර පොත අස්ථානගත වීම නිසා අනුපිටපතක් නිකුත් කිරීම | 5,000.00 |
| 6. | කුළී වැන්රථ මගී සේවා අවසර පත්‍ර පොතේ පිටු අවසන් වීම/ අබලන්වීම හේතුවෙන් අනු පිටපතක් නිකුත් කිරීම. | 500.00 |
| 7. | කුළී වැන්රථ මගී සේවා අවසරපත්‍ර ලේඛනය *(අනුපිටපත)* | 300.00 |
| 8. | කුළී වැන්රථ අවසර පත්‍රයක් වෙනත් ඉල්ලුම්කරුවෙකුට පවරාදීම | 15,000.00 |
| 9. | අවසරපත්‍රහිමියා මියගියවිට නීත්‍යානුකූල අයිතිය හිමි වන පුද්ගලයාට අවසරපත්‍රය පැවරීම *(භාර්යාවට/ස්වාමිපුරුෂයාට හෝ දරුවන්ට) (අංක 01, 03 සහ 07 යන ගාස්තුව ද එකතු විය යුතුය).* | 1,500.00 |
| 10. | අවසරපත්‍ර හිමියා මියගිය විට නීත්‍යානුකූල අනුප්‍රාප්තිකයෙකු නොවන පුද්ගලයෙකුට අවසර පත්‍රය පැවරීම *(අංක 8 යන ගාස්තු ක්‍රමය අදාල වේ). (අංක 01, 03 සහ 07 යන ගාස්තුව ද එකතු විය යුතුය).* | |
| 11. | කුළී වැන්රථ මගී සේවා අවසර පත්‍රයට අදාළ කුළී වැන්රථය මාරු කිරීම | 1,000.00 |
| 12. | වෙනත් පරිඝනක සටහන් ලබා ගැනීම *(මුද්‍රිත එක් කොළයකට)* | 50.00 |

## *උපලේඛනය 05*

**කුලී වෑන්රථ ප්‍රවාහන සේවා අවසර පත් කොන්දේසි කඩකිරීම වෙනුවෙන් ගනු ලබන ක්‍රියා මාර්ග/පරිපාලන ගාස්තු අය කිරීම.** (1)

| කොන්දේසි කඩකිරීමේ ස්වභාවය. | පලමු වරට ගනු ලබන ක්‍රියා මාර්ග | දෙවන වරට ගනු ලබන ක්‍රියා මාර්ග | තෙවන වරට ගනු ලබන ක්‍රියා මාර්ග | සතරවන වරට ගනු ලබන ක්‍රියා මාර්ග | පස්වන වරට ගනු ලබන ක්‍රියා මාර්ග | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| **ඉතා බරපතල වැරදි** | | | | | | |
| 1 මගීන් සඳහා වලංගු අසීමිත රක්ෂණ බලපත්‍රයක් නොමැතිව ධාවනය කිරීම. | අවසර පත්‍රය අවලංගු කිරීම. | - | - | - | - | - |
| **බරපතල වැරදි** | | | | | | |
| 1 මාසයකට වඩා වැඩි කාලය ඉක්මවූ මාර්ග සේවා අවසර පත්‍රයක් භාවිතා කිරීම.<br>2 නියමිත ගාස්තුවට වඩා ගාස්තු අය කිරීම.<br>3 ගාස්තු සටහන ප්‍රදර්ශනය නොකිරීම.<br>4 කුලී වෑන්රථ පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් නොතිබීම.<br>5 ධාවනයේ දී රියැදුරු මහතා ජංගම දුරකථනය භාවිතා කිරීම.<br>6 නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බලලත් නිලධාරීන්ට (මාර්ග/ ජංගම පරික්ෂක, ස්ථාන භාර නිලධාරීන්, වේලාසටහන් කරුවන් ඇතුළුව නිලධාරීන්) තර්ජනය කිරීම හා / හෝ බැණ වැදීම හා/හෝ ශාරීරික හිංසා පිඩා කිරීම. | අවවාද සහ රු 2,500/- අයකිරීම. | අවවාද සහ රු 5,000/- අයකිරීම | අවසර පත්‍රය අවලංගු කිරීම. | - | - | - |
| **ප්‍රධාන වැරදි** | | | | | | |
| 1 මාසකට වඩා අඩු කාලපරිච්ජේදයක් සඳහා කාලය ඉකුත් වූ මාර්ග සේවා අවසර පත්‍රයකින් ධාවනයේ යෙදීම.<br>2 බලයලත් නිලධාරීන්ට කුලී වෑන්රථයේ අදල ලේඛන පරික්ෂා කිරීමට සහය නොදක්වා ප්‍රතික්ෂේප කිරීම.<br>3 වායු සමීකරණ නියමිත මට්ටමකින් පවත්වා ගෙන නොයාම. | අවවාද රු.1,000/- අයකිරීම | තරයේ අවවාද සහ රු. 2,500/- අයකිරීම. | අවසර පත්‍රය අවලංගු කිරීම | - | - | - |
| 4 අදල සේවාවට වලංගු අවසර පත්‍රයක් නොමැතිව ධාවනය කිරීම. | අවවාද සහ රු. 3,000/- අයකිරීම. | අවවාද සහ රු. 7500/- අයකිරීම. | තරයේ අවවාද සහ රු 15,000/- අයකිරීම. | අවසර පත්‍රය අවලංගු කිරීම. | - | - |
| 5 ලියාපදිංචි නොකළ රියැදුරෙකු සේවයේ යෙදවීම.<br>6 කාර්මික තත්වයේ ධාවනයට යෝග්‍ය නොවන කුලී වෑන්රථයක් ධාවනයේ යෙදවීම, කුලී වෑන් රථයේ පිරිසිදුකම සේවාවට යෝග්‍ය මට්ටමෙන් පවත්වාගෙන නොයාම.<br>7 කුලී වෑන්රථයේ සේවයේ යෙදි සිටියදී නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ගෞරවයට අපහාස වන ආකාරයට මහජනතාව ඉදිරියේ කලහ කර ගැනීම හා/හෝ ගැටුම් ඇති කර ගැනීම.<br>8 නැගෙනහිර පලාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නිලධාරීන්ගේ අණට අකීකරු වීම<br>9 කුලී වෑන්රථයේ සේවයේ යෙදී සිටියදි රියදුරු මහතා විසින් දුම්පානය කිරීම. | අවවාද සහ රු 1,000/- අයකිරීම | අවවාද සහ රු 2,500/- අයකිරීම | තරයේ අවවාද සහ රු 6,000/- අයකිරීම | අවසර පත්‍රය අවලංගු අයකිරීම | - | - |

| | කොන්දේසි කඩකිරීමේ ස්වභාවය. | (2) පලමු වරට ගනු ලබන ක්‍රියා මාර්ග | දෙවන වරට ගනු ලබන ක්‍රියා මාර්ග | තෙවන වරට ගනු ලබන ක්‍රියා මාර්ග | සතරවන වරට ගනු ලබන ක්‍රියා මාර්ග | පස්වරට ගනු ලබන ක්‍රියා මාර්ග | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 10 | මගීන්ට අකාරුණික වීම. | අවවාද සහ රු 1,500/- අයකිරීම. | තරයේ අවවාද සහ රු 3,000/- අයකිරීම. | අවසර පත්‍රය අවලංගු කිරීම. | - | - | - |
| 11 | රියදුරු නිළ ඇඳුම/ නිළ හැඳුනුම්පත පැළැද නොසිටීම | අවවාද සහ රු 1,000/- අයකිරීම | අවවාද සහ රු 2,000/- අයකිරීම | අවවාද සහ රු 3,000/- අයකිරීම | තරයේ අවවාද සහ රු 5,000/- අයකිරීම | අවසර පත්‍රය අවලංගු කිරීම | - |

**සුළු වැරදි**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | මාර්ගයේ ධාවනය වන අනෙකුත් වාහන වලට අවහිර වන ආකාරයට කුළී වැන්රථය නවතා මගීන් නංවා ගැනීම හෝ බැස්සවීම. | | | | | | |
| 2 | පදික මාරුව මත නවතා මගීන් නංවා ගැනීම හෝ බැස්සවීම. | | | | | | |
| 3 | කුළී වැන්රථ නැවැතුම්පොලට ඇතුල් වන සහ පිටවන දෙරටු අවහිර වන ආකාරයට කුළී වැන්රථය නතර කර තැබීම. | | | | | | |
| 4 | වලංගු රියදුරු වෛද්‍ය සහතිකයක් නොතිබීම. | | | | | | |
| 5 | ධාවනයට අදල ලියකිවිලි කුළී වැන්රථයේ තබා නොගැනීම. | | | | | | |
| 6 | අනුමත ආසන සංඛ්‍යාවට වඩා අඩුවෙන් හෝ වැඩියෙන් සකස් කර කුළී වැන්රථය ධාවනයේ යෙදවීම. | අවවාද සහ රු 500/- අයකිරීම | අවවාද සහ රු 1,000/- අයකිරීම | අවවාද සහ රු 2500/- අයකිරීම | තරයේ අවවාද සහ රු 5,000 අයකිරීම | අවසර පත්‍රය අවලංගු කිරීම. | - |
| 7 | **"දුම්බීම තහනම්"** පුවරුවක් කුළී වැන්රථය තුළ මගීන්ට ප්‍රදර්ශනය නොකිරීම. | | | | | | |
| 8 | කුළී වැන් රථය තුළ දුම්පානය කිරීමට ඉඩ දීම | | | | | | |
| 9 | ක්‍රියාත්මක ගිණි නිවීමේ උපකරණ/ ක්‍රියාත්මක ඔරලෝසුවක් සවිකර නොතිබීම. | | | | | | |
| 10 | කුළී වැන් රථයෙහි ඉදිරිපස සහ පිටුපස අනුමැතිය නොලත් රූඳවීම්, ලිවීම්/ ස්ටිකර් සහිත වීම. | | | | | | |
| 11 | අයිතිකරුගේ ලිපිනය නියමිත ස්ථානයේ ප්‍රදර්ශනය නොකිරීම. | | | | | | |
| 12 | අනුමැතියක් නොමැතිව අතිරේක සවිකිරීම් සහිත වීම. | | | | | | |
| 13 | මගීන් සහිතව ධාවනයේ අතර මග දී ඉන්ධන පිරවුම් හලකින් ඉන්ධන ටැංකියට ඉන්ධන පිරවීම. | | | | | | |
| 14 | නියමානුකූලව නඩත්තු කරනු ලබන ධාවන සටහන් පත්‍රයක් නොතිබීම. | | | | | | |
| 15 | කුළී වැන්රථයේ ඉදිරිපස සහ පිටුපස නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ලාංඡනයක් නොතිබීම. | | | | | | |
| 16 | වින්ඩ්ස්ක්‍රීන් ලේබලය ප්‍රදර්ශනය නොකිරීම. | අවවාද සහ රු 500/- අයකිරීම | අවවාද සහ රු 1,000/- අයකිරීම | අවවාද සහ රු 2500/- අයකිරීම | තරයේ අවවාද සහ රු 5,000 අයකිරීම | අවසර පත්‍රය අවලංගු කිරීම. | - |
| 17 | ප්‍රථමාධාර පෙට්ටියක් නොතිබීම / එය අංගසම්පූර්ණ නොවීම | | | | | | |
| 18 | රියදුරු ලියාපදිංචි අංකය කුළී වැන්රථය තුළ ප්‍රදර්ශනය නොකිරීම. | | | | | | |
| 19 | වලංගු යෝග්‍යතා සහතිකයක් හෝ තත්ව වාර්තාවක් නොතිබීම. | | | | | | |
| 20 | වෙනත් සුළු වැරදි. | | | | | | |



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.